

# Centrelink වෙත කිව යුතු දෑ

We speak your language ☎ 13 1202

*Things to tell Centrelink* - **Sinhalese**

ඔබ Centrelink ගෙවීමක් ලබයි නම් නිවැරදි ප්‍රමාණයන් ගෙවීම සඳහා ඔබේ ආදායම සහ තත්වයන්ගේ ඇතිවන වෙනස් වීම් Centrelink වෙත දැනුම් දීම අවශ්‍ය වේ.

අප වෙත දැනුම් දිය යුතු සියල්ල Centrelink වෙතින් ලැබෙන ලිපි වල සඳහන් වේ. ලිපි වලින් කියැවෙන දේ තේරුම් ගත නොහැකි නම් දුරකථන අංක 13 1202 අමතන්න. අප වෙත කිවයුතු සමහරක් නම් :

- ඔබ හෝ ඔබේ සහකරු/කාරිය රැකියාවක නියැලීම අරඹයි නම් සහ ඔබ කොපමණ උපයයිද යන වග (බදු අය කිරීමට පෙර)
- ඔබ හෝ ඔබේ සහකරු/කාරිය වැඩෙහි යෙදෙන පැය ප්‍රමාණය වෙනස් කරයි නම්
- ඔබ විවාහ වේ නම්, විවාහය වැනි සම්බන්ධතාවයක් මත දිවි අරඹයි නම්, වෙන් වේ නම් හෝ නැවත සමාදාන වේ නම්
- ඔබේ ලිපිනය වෙනස් කරයි නම්
- ඔබ ගෙවන ගෙවල් කුලී හෝ ඉදුම් හිටුම් ගාස්තු ප්‍රමාණයන්හි වෙනසක් වේ නම්
- ඔබ ස්ථිර වශයෙන් හෝ තාවකාලිකව ඔස්ට්‍රේලියාවෙන් පිටවේ නම් **සහ**
- ඔබේ දරුවන් ඔබේ රැකවරණයෙන් නික්ම යයි නම් හෝ රැකවරණයට පැමිණේ නම්.

**සඳහන** ඃ ඔබේ සියළුම වැටුප් පත් ඉල්ලු විටෙක Centrelink වෙත සැපයිය හැකි පරිදි ළඟ තබාගන්න.

## Centrelink වෙත පවසන්නේ කෙසේද?

- දුරකථන අංක **13 1202** ඇමතීමෙන්
- කාර්යාලයයක කලින් වෙන් කරවා ගත් ඉඩ ප්‍රස්ථාවන් සඳහා සහභාගී වීමෙන්
- අපෙන් ලැබෙන පෝරම පත් සම්පූර්ණ කිරිමෙන් පසු අපවෙත ආපසු **එවීමෙන්**
- ලිපි මගින්.

## Centrelink වෙත පැවසිය යුත්තේ කිනම් විටකදීද?

- සේවාලාභියකු වෙතින් ආදයමක් ලබන විටදී, **සහ**
- ඔබේ තත්වයෙහි වෙනසක් සිදුවු වහාම.

**ඔබේ සහකරු/කාරිය අවශ්‍ය පරිදි වෙනස් වීම් අප වෙත දැනුම් නොදුන් විට එය පහත ප්‍රතිඵල ගෙන දෙනු ඇත** ඃ

- ඔබේ ගෙවීම් නැවැත්වීම හෝ ප්‍රමාද වීම **සහ/හෝ**
- ඔබ විසින් ආපසු ගෙවිය යුතු වන වැඩිපුර කරන ලද ගෙවීමක් **සහ/හෝ**
- සමහර අවස්ථාවලදී, අමතර ආපසු අයකර ගැනීම් ගාස්තු.

## ප්‍රයෝජනවත් උපදෙස්

- ඔබ විසින් අපවෙත කිව යුතු දෑ පිළිබඳව අවිනිශ්චිත නම් Centrelink අමතන්න.
- අප අමතන විට ඔබේ Centrelink Reference Number (Centrelink යොමු අංකය) අප වෙත පැවසීමෙන්

www.centrelink.gov.au

Australian Government

Centrelink
giving you options

කටයුතු ඉක්මන් කරගත හැක. මෙය අප විසින් එවන ලිපිවල සඳහන් වේ.

- ඔබේ තත්වයන්හි ඇති වන වෙනස් වීම් පිළිබඳ අප වෙත දැනුම් දීමට අන් පුද්ගලයකු වෙත Centrelink අනුමැතිය ලබාදිය හැකිය. කෙසේ වෙතත් Centrelink ඔබේ තොරතුරු ලබා ගත් බවත් ඒ පිළිබඳව ක්‍රියා කළ බවත් සොයා බැලීම ඔබේ වගකීම වේ.
- ඔබේ අයිතිය සහ අවශ්‍යතා පිළිබඳව දැන ගැනීම සඳහා Centrelink කාර්යාලයෙහි පැවැත්වෙන තොරතුරු සම්මන්ත්‍රණයන්ට සහභාගි වන්න.
- ඔබේ කාර්යාලයයෙහි ඇති *'Going Overseas?'* *(විදෙස් ගත වන්නේද?)* පත්‍රිකාව වැනි තොරතුරු පත්‍රිකා කියවන්න.

සිංහල භාෂාවෙන් Centrelink හා කථා කිරීමට දුරකථන අංක **13 1202*** අමතන්න.
ඔබේ බසින් තොරතුරු **www.centrelink.gov.au** යන වෙබ් අඩවියට පිවිසීමෙන්ද ලබාගත හැක.

**සම්මත දුරකථන සේවාවක් මගින් ඔස්ට්‍රේලියාව ඇතුලත ඕනෑම ස්ථානයක සිට "13" පටන්ගන්නා දුරකථන අංකයන් සඳහා ප්‍රාදේශීය ඇමතුම් ගාස්තුවකට වැඩි නොවන මිලකින් ඇමතිය හැකිය (දුරකථන ගාස්තු අයකිරීම් දුරකථන සේවාදායකයා අනුව වෙනස් විය හැකිය). අංක "1800" න් පටන් ගන්නා දුරකථන අංක ගාස්තුවලින් නිදහස්ය. පොදු හෝ ජංගම දුරකථන වලින් කෙරෙන ඇමතුම් සඳහා වැඩි මුදලක් අය කෙරෙනු ඇත.*